මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක :**PRE/2024/07** **2024.07.31**

**ජනාධිපතිවරණය - 2024.09.21**
**තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම.**

ඉදිරි ජනාධිපතිවරණ ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම 2024.08.05 වන දින අවසන් වේ.

තැපැල් ඡන්ද අයදුම්කරුවන්ට තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කිරීම සඳහා ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචියට අදාළ තොරතුරු මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වූ www.elections.gov.lk මගින් **2024 ජනාධිපතිවරණ ඡන්දහිමි නාමලේඛන තොරතුරු** (2024 ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනය) යනුවෙන් දැක්වෙන දිගුව වෙත පිවිස තමන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කිරීමෙන් ලබාගැනීමේ පහසුකම් සලසා දී ඇත.

පොදු මහජනතාවගේ වෙනත් අවශ්‍යතා ඉටු කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් 2024.07.01 දින සහතික කරන ලද 2024 ඡන්දහිමි නාමලේඛනය ද නිල වෙබ් අඩවියට උඩුගත කොට ඇත.

එසේ වුව ද රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවා වෘත්තීය සමිති එකතුවේ කැඳවුම්කරු විසින් මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ සඳහන් වන 2024.07.31 දින සහතික කරන ලද නාමලේඛනයේ තොරතුරු අනුව තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීමෙන් වළකින ලෙස කරන ලද දැනුම්දීම හා තැපැල් ඡන්ද අයදුම්පත් භාර ගැනීම 2024.08.15 දින දක්වා සිදු කරන බවට වූ මුහුණු පොතේ ප්‍රචාරය කරන දැන්වීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ කිසිදු වගකීමක් නොමැති අතර එහි සඳහන් තොරතුරු සම්පූර්ණයෙන්ම අසත්‍ය හා ජනතාව නොමග යවන සුළු ප්‍රචාරයක් බව නිවේදනය කරමි.

ඡන්ද විමසීමට අදාළ ව්‍යවස්ථාපිත කාර්යයන් සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව විසින් චක්‍රලේඛ/ උපදෙස් ලිපි මගින් රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්ට හා ජනතාව වෙත ලබාදෙන උපදෙස් හා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ පළ කරන දැන්වීම්වලට අමතරව වෙනත් පාර්ශ්ව විසින් සිදු කරන ප්‍රචාර සම්බන්ධව මැතිවරණ කොමිෂන් සභාව වගකීමට බැඳී නොමැති බව ද මෙමගින් නිවේදනය කරනු ලැබේ.

එබැවින් ව්‍යාජ ප්‍රචාරවලට හසු නොවී මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ තමන්ගේ ලියාපදිංචියට අදාළ තොරතුරු අනුව තැපැල් ඡන්ද අයදුම්පත් සම්පූර්ණ කොට ස්වකීය ආයතනයේ සහතික කිරීමේ නිලධාරියා මගින් 2024.08.05 දිනට ප්‍රථම ඡන්දහිමි නාමලේඛනයේ නම සඳහන් දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත එවන ලෙස සියලුම තැපැල් ඡන්ද දායකයන්ගෙන් මැතිවරණ කොමිෂන් සභාව ඉල්ලා සිටී.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්